විසර්ජන ශීර්ෂය: 258 - මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය

**1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්**

(අ) දිස්ත්‍රික් පරිපාලනය
(ආ) ව්‍යවස්ථාපිත කටයුතු
(ඇ) අභ්‍යන්තර පාලනය ශක්තිමත් කිරීම
(ඈ) ආගමික හා සදාචාර සංවර්ධනය
(ඉ) සේවක සුභසාධනය
(ඊ) සම්බන්ධීකරණ හා මිත්‍රශීලි පරිපාලනය
(උ) සංවර්ධන වැඩසටහන් හා ගම නැගුම
(ඌ) රාජ්‍ය නොවන සංවිධාන හා ප්‍රජා සහභාගීත්වය
(එ) මාධ්‍ය සම්බන්ධීකරණය
(ඒ) පරිපාලනයේ ආකල්ප වර්ධනය හා පුහුණුව
(ඔ) තොරතුරු තාක්ෂණ භාවිතය

**1.2. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල**

(අ) ගඟවට කෝරළෙ
(ආ) පාතහේවාහැට
(ඇ) දෙල්තොට
(ඈ) උඩපළාත
(ඉ) උඩදුම්බර
(ඊ) පාතදුම්බර
(උ) පන්විල
(ඌ) හතරලියද්ද
(එ) පුජාපිටිය
(ඒ) තුම්පනේ
(ඔ) මිනිපේ
(ඕ) කුණ්ඩසාලේ
(ක) දොළුව
(ග) ගඟඉහළ කෝරළේ
(ච) යටිනුවර
(ජ) උඩුනුවර
(ට) හාරිස්පත්තුව
(ඩ) අකුරණ
(ණ) මැදදුම්බර
(ත) පස්බාගේ කෝරළේ

## 1.3. විගණන විෂය පථය

මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 04 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.5 විගණන නිරීක්ෂණ

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.14 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) විසර්ජන ගිණුම

### (i) මුළු ප්‍රතිපාදනය හා වියදම

සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,031,282,164ක් වූ අතර, වර්ෂය අවසාන වන විට ඉන් රු.976,567,133 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරි වීම රු.54,715,031ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5.3ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තු ගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 638,025,000 | 905,082,164 | 1,316,320 | 0.1 |
| මූලධන | 86,200,000 | 126,200,000 | 53,398,711 | 42.3 |
| එකතුව | 724,225,000 | 1,031,282,164 | 54,715,031 | |

(ii) **අයවැය විචලනය**

වැය විෂයයන් 06ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 14ත් සියයට 47ත් අතර පරාසයක ප්‍රතිශයක් ගෙන තිබුණි.

(iii) **ජංගම නොවන වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(ඒ) පුනරාවර්තන වැය විෂයයන් යටතේ මිලදී ගන්නා ලද වටිනාකම රු.34,425ක් වූ ස්ථාවර වත්කම්, විසර්ජන ගිණුමේ ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි.

(බී) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20ක භාවිතයට ගනු ලබන වාහන 48ක් තක්සේරු කර ජංගම නොවන වත්කම් සංචලන වාර්තාවට ගෙන නොතිබුණි.

(iv) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා අමාත්‍යාංශ 27කින් රු.3,596,846,981ක හා දෙපාර්තමේන්තු 14කින් රු.1,827,816,544ක ප්‍රතිපාදන වශයෙන් රු.5,424,663,525ක් ලැබී තිබූ අතර, ඉන් පිළිවෙලින් රු.3,274,503,452ක් හා රු.1,509,532,104ක් උපයෝජනය කර ගෙන තිබුණි. ඉතිරිය රු.322,343,529ක් හා රු.318,284,440ක් හෙවත් සියයට 9 ක් හා සියයට 17 ක් විය.

(ආ) **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 76,500,000 | 66,391,677 | 53,000,000 | 68,035,966 | 198,000,000 | 189,393,999 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 25801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,628,855 ක් වු අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

(ii) ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 උප වගන්තිය ප්‍රකාරව වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගෙන් රජයට අය විය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අය කර ගත නොහැකි අවස්ථාවලදී එම මුදල් ඇපකරුගෙන් අය කරගත යුතු බවට නියම කර තිබියදී, ප්‍රධාන ණයකරුගෙන් අයකර ගත නොහැකි වු රු.1,133,396ක් වූ ණය ගැති ශේෂ 15ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් රජයට අය විය යුතු මුදල් ප්‍රධාන ණයකරුගෙන් අය කර ගත නොහැකි අවස්ථාවලදී ඇපකරුගෙන් අය කරගත යුතු බවට ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 උප වගන්තියෙන් නියම කර තිබියදී, එසේ කටයුතු නොකිරීම හේතුවෙන් රු.67,285ක් වූ ණයගැති ශේෂ 04ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා අය නොවී පැවතුණි.

(iv) මිය ගිය හෝ විශ්‍රාම ගිය නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු ණය ශේෂ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ xxiv පරිච්ජේදයේ 4.2.3, 4.2.4 සහ 4.4 වගන්ති ප්‍රකාරව කටයුතු නොකිරීම හේතුවෙන් එබදු නිලධාරීන් 04 දෙනෙකුගෙන් එකතුව රු.277,290ක් වූ ණයගැති ශේෂ අය වී නොතිබුණි.

(v) ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ 2004 ඔක්තෝබර් 11 දිනැති අයවැය චක්‍රලේඛ අංක 118 පරිදි ස්ථාන මාරු වී ගොස් අවුරුදු 2කට වැඩි කාලයක් ගත වී ඇති නිලධාරීන් 03 දෙනෙකුගෙන් අයවිය යුතු රු.801,946ක ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(vi) අංක: 30/2008 හා 2008 දෙසැම්බර් 31 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව ප්‍රදානය කළ හැක උපරිම ණය හිමිකම රු.250,000ක් ඉක්මවා ප්‍රාදේශීය ලේකම්වරයෙකු සඳහා රු.51,623ක අත්තිකාරම් මුදලක් 2012 වර්ෂයේ ගෙවා තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.210,348,462 ක් වූ අතර, ඒ පිළිබඳව විස්තර පහත දැක්වේ.

| ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6003/34 | 210,348,462 |

## 1.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

**වාර්ෂික ප්‍රසම්පදාන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

පහත විග්‍රහ කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රියව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තු අරමුදල් යටතේ පන්විල ප්‍රාදේශිය ලේකම් කාර්යාල පරිශ්‍රයේ 2008 වර්ෂය තුළ රු.1,328,008ක් වැය කර ජාතික හැඳුනුම්පත් නිකුත් කිරීමේ කාර්යාලයක් සඳහා ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර, විගණන දිනය වූ 2013 මාර්තු 25 දින වන විට වසර 05 ක පමණ කාලයක් ගත වී ඇතත් එම කාර්යාලය ස්ථාපිත කර නොතිබුණි.

(ii) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිල්ල තුළ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය පවත්වාගෙන ගොස් තිබුණු වර්ග අඩි 1505ක ප්‍රමාණයකින් යුක්ත ව කාර්යාල ඉඩකඩ ප්‍රමාණය කිසිදු ප්‍රයෝජනයකට නොගෙන වසර 12ක පමණ කාලයක සිට වසා දමා තිබුණි.

(ආ) **බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

උස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ඇතැම් වත්කම් අවිධිමත් ලෙස බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(i) 2003 පෙබරවාරි 01 දින සිට මාස 6ක කාල සීමාවකට ශ්‍රී ලංකා යුධ හමුදා පොලිස් සේවා බලකායේ පරිහරණය සඳහා මුදා හැර තිබුණ දිස්තික් ලේකම් කාර්යාලයට අයත් මහනුවර රජවීදියේ පිහිටි අංක:71 දරන අතිරේක දිස්ත්‍රික් ලේකම් සඳහා වූ රජයේ නිවස 2013 දෙසැම්බර් මස වන විටත් ආපසු භාර ගෙන නොතිබුණි.

(ii) පාතදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාල භූමියේ පිහිටි ගොඩනැගිලි 03ක් ව්‍යාපාරික කටයුතු සඳහා බාහිර පාර්ශවයන් වෙත ගිවිසුම්වල එළඹීමෙන් තොරව පවරා දී තිබූ අතර, එම ගොඩනැගිලි සඳහා කිසිදු බදු මුදලක් හෝ අයකර ගෙන නොතිබුණි.

(ඇ) **පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) පාතහේවාහැට ප්‍රාදේශීය ලෙකම් කාර්යාල බල ප්‍රදේශයට අයත් අනවසර ඉඩම් කට්ටි 229කට අයත් ඉඩම්වල අයිතිය ලබා ගැනීම, පවරාදීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වැලිගල්ල ග්‍රාම නිලධාරී වසමෙහි පිහිටි හෙකටයාර් 0.1782 ක බිම් ප්‍රමාණයෙන් යුතු ඉඹුල්දාගොඩවත්ත ඉඩම 1983 වර්ෂයේදී රජයට පවරා ගෙන වර්ග අඩි 2285 කින් යුත් දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකර තිබූ අතර, 2012 වර්ෂය ආරම්භයේ සිට මෙම ඉඩමෙහි අනවසරයෙන් දේශපාලන පක්ෂ සම්බන්ධීකරණ කාර්යාලයක් පවත්වාගෙන ගොස් තිබුණි.

(iii) 1961 අංක 60, 1964 අංක 5, 1964 අංක 28 හා 1979 අංක 8 දරන පනත්වලින් සංශෝධිත ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 17 වැනි වගන්තිය පරිදි හා වන්දි මුදල් පනතේ 38(අ) වගන්තිය යටතේ භුක්තිය භාර ගැනීමට ප්‍රථම අදාළ වන්දි මුදල ප්‍රදානය නොකර, උඩුනුවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් භුක්තිය භාර ගැනීමෙන් වර්ෂ ගණනාවකට පසු වන්දි මුදල් ගෙවා තිබීම හේතුවෙන් භුක්තිය භාරගත් දින සිට වන්දි මුදල් ප්‍රදානය කරන ලද දිනය දක්වා වන්දි මුදලට අමතරව ඉඩම් කට්ටි 45ක් සඳහා රු.1,468,995ක පොලී මුදලක් ගෙවීමට සිදුව තිබුණි.

(ඇ) **බේරුම් නොකළ බැරකම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.1,151,053 ක් වූ අතර, ඒ පිළිබඳ කාලවිශ්ලේෂණයක් පහත දැක්වේ.

| වර්ෂ 01ට අඩු | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| රු. | රු. |
| 1,151,053 | 1,151,053 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රු.140,596ක බැරකම් ගිණුමේ බැරකම් පිළිබඳ ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි.

(ii) වැය විෂයයන් 07 කට අදාළ බැරකම් වර්ෂය තුළ නිරවුල් කළේ නම් රු.1,297,179ක ප්‍රතිපාදන ඉක්මවීමක් සිදුවන බව නිරීක්ෂණය විය.

(iii) 'අපේක්ෂිත ප්‍රමාණයට වඩා වියදම් අඩුවෙන් පැවතී නිසා ප්‍රතිපාදන ඉතිරියක් ඇති වේ' යනුවෙන් සඳහන් කරමින් වැය විෂයයන් 02ක රු.30,500 ක ප්‍රතිපාදන වෙනත් වැය විෂයයන්ගේ අතිරික්ත වියදම් පියවීම සඳහා මාරු කර තිබුණු අතර, පසුව එම වැය විෂයයන් දෙක යටතේ රු.93,504ක බැරකම් ඇති වී තිබුණි.

## 1.8 අනුකූල නොවීම්

### නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල සඳහන් විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | **ආයතන සංග්‍රහය**<br><u>xv වැනි පරිච්ඡේදයේ</u> | | |
| | (i) 4.1 වගන්තිය | - | 2012 ජුනි 02 සිට අගෝස්තු 24 දක්වා දින 54ක කාල සීමාවක් සඳහා සම්පූර්ණ වැටුප් සහිත පුහුණු පාඨමාලාවක් සඳහා ඉන්දියාවට ගොස් සිටි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරියෙකු පුහුණුවෙන් පසු අනිවාර්ය සේවා කාලය සඳහා ගිවිසුමකට ඇතුළත් වී නොතිබුණි. |
| | (ii) 9.6 වගන්තිය | 78,738 | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ නිලධාරීන් 5 දෙනෙකුට විදේශ ගමන් වෙනුවෙන් ලබාදුන් උණුසුම් ඇදුම් දීමනා එම කාර්යය සඳහා වැය කළ බවට සහතික හෝ කුවිතාන්සි ඉදිරිපත් කර නොතිබුණු අතර, අවුරුදු 5ක කාලපරිච්ඡේදයක් තුළ මෙම දීමනාව එක් වතාවක් පමණක් ගෙවා ඇති බවට තහවුරු කර ගැනීමට ද නොහැකි විය. |
| (ii) | **මුදල් රෙගුලාසි** | | |
| | මු.රෙ. 880 | | ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක සේවයේ නියුතු ග්‍රාම නිලධාරීන් 111 දෙනෙකුගෙන් ඇප තැන්පත් ලබා ගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ | | |
| | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ අංක: HAF-3-ADMIN-04-002 හා 2012 නොවැම්බර් 17 දිනැති ලිපියේ 06 ජේදය | | ග්‍රාම නිලධාරීවරුන් 131 දෙනෙක් අදාළ කොට්ඨාශය තුළ පදිංචි වී නොතිබුණි. |
| **(iv)** | වෙනත් චක්‍රලේඛ | | |
| | ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශ ලේකම්ගේ අංක 2011/1 දරන චක්‍රලේඛය | | පෙර පාසල් දරුවන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබා දීම සම්බන්ධයෙන් සිදුකරන ලද නියැදි පරීක්ෂණයට අනුව උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 125 කන් සමාලොචිත වර්ෂයේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණේ වසම් 21 ක පමණක් විය. |
| | 2006 ජුලි 31 දිනැති සමෘද්ධි කොමසාරිස් ජනරාල්ගේ පෝෂණ දීමනා චක්‍රලේඛ අංක 21 | 153,000 | නියැදි පරීක්ෂණයට අනුව උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමෘද්ධි නිලධාරීන් මාර්ගයෙන් නිසි දැනුවත් කිරීම් සිදු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ග්‍රාම නිලධාරී වසම් 125කින් ගැබිණි හා කිරිදෙන මව්වරුන් හට පෝෂණ දීමනා ලබා දී ඇත්තේ වසම් 60ක මව්වරුන් 120 කට පමණක් විය. තවද එම මව්වරුන්ට ද රු.153,000 ක් වටිනා මුද්දර 306ක් ලබා දීමට කටයුතු කර නොතිබීම නිසා එම මුද්දර අවලංගු වී තිබුණි |

## 1.9 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ප්‍ර.ලේ.කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු |
|---|---|---|---|---|
| | | රු. | | |
| උඩපළාත | ඉලංගවත්ත පෙර පාසලේ අළුත්වැඩියාව | 980,000 | 2012.12.11 | තාක්ෂණ නිලධාරී කාර්ය බහුල වීම හේතුවෙන් ආරම්භ කළ නොහැකි වීම. |
| ගලගෙදර | කහල්පිටිය වසමේ පලිපාන වත්තට යන මාර්ගය සංවර්ධනය කිරීම | 980,000 | - | ඉඩම් ආරවුල් හේතුවෙන් යෝජනාව අවලංගු කර යළි ඇරඹීමේදී 2012 දෙසැම්බර් 31 දින වන විට අනුමත කර ගැනීමට නොහැකිවීම. |
| පාතහේවාහැට | හිප්පොලගම මැදපාර සංවර්ධනය කිරීම | 974,000 | - | සංශෝධන අනුමත කර ගත නොහැකි වීම. |

| | | | | |
|---|---|---|---|---|
| | තලාතුඔය බෝධිරාජාරාම විහාරය අසළ විකල්ප මාර්ගය සංවර්ධනය කිරීම | 974,000 | - | -එම- |
| | නුගලියද්ද දඹගහතැන්න මාර්ගය | 974,000 | - | -එම- |
| | වෙලේගම ජල යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම | 974,000 | - | -එම- |
| යටිනුවර | පානබොක්ක මහළිද අසළින් යන පාර | 1,000,000 | 2012.04.15 | සංශෝධන අනුමත නොවීම |
| | කඩුගන්නාව ජල යෝජනා ක්‍රමය | 1,000,000 | 2012.04.15 | ප්‍රතිපාදන ලැබී ඇති වසමට එවැනි යෝජනා ක්‍රමයක අවශ්‍යතාවයක් නොවීම. |
| | දෙහිඅංග බහුකාර්ය මධ්‍යස්ථානය ඉදිකිරීම | 1,000,000 | 2012.04.15 | පල්ලියේ අනුමැතිය නොලැබීම. |

(ආ) **ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | 2012 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතුව |
|---|---|---|---|---|---|
| | රු. | | | රු. | |
| **<u>මිණිපේ</u>** | | | | | |
| වේරගංතොට ජල යෝජනා ක්‍රමය ඉදිකිරීම 1 අදියර | 1,000,000 | 2012.07.10 | 2012.12.31 | 286,155 | අයහපත් කාලගුණික තත්තවයක් පැවතීම. |
| **<u>උඩපළාත</u>** | | | | | |
| 20/22/kan මහවිල ශ්‍රී මුරුගන් දේවාලය අළුත්වැඩියා කරීම | 48,500 | - | - | - | කාලය ප්‍රමාණවත් නොවීම |
| **<u>හතරලියද්ද</u>** | | | | | |
| උඩන්නාදෙණිය ජල යෝජනා ක්‍රමය | 989,422 | 2012.11.14 | 2013.06.30 | 196,000 | අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අඩාල වීම |
| **<u>යටිනුවර</u>** | | | | | |
| මුදලිවත්ත පාර 1 වැනි පටුමග ප්‍රතිසංස්කරණය කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | - | -එම- |
| දියකෙලිනාවල රජමහා විහාර මධ්‍යස්ථානයට පිවිසුම් මාර්ගය හා පාලම ඉදිකිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | 170,730 | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| විහාර මාවත කොන්ක්‍රීට් කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | 217,778 | -එම- |
| සියඹලාගොඩ ප්‍රජා ශාලාව සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | 860,953 | -එම- |
| පන්සල අසළ සිට ප්‍රයිම්ලැන්ඩ්ස් වත්තේ කොන්ක්‍රීට් අතුරා පැති බැම්ම සකස් කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | 559,648 | අයහපත් කාලගුණික තත්ත්වය |
| සමනල උයන මාර්ගය කාණුව සමඟ කොන්ක්‍රීට් කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | - | -එම- |
| උඩවෙල කණිෂ්ඨ විද්‍යාලය අසලින් ජනපදය දක්වා දිවෙන මාර්ගය පිළිසකර කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | - | -එම- |
| කුරුදුවත්ත බහුකාර්ය ශාලාව සංවර්ධනය | 980,000 | 2012.04.05 | 2012.12.31 | 679,812 | -එම- |
| වෙරලුගොල්ල සිට මොරගොල්ල ප්‍රජා ශාලාව දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | 217,778 | -එම- |
| රණවන සිට බරම්මනේ හරහා සන්දිපොල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | - | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| දෙහිඅංග මැදපළාත ක්‍රීඩාපිටිය වැඩිදියුණු කිරීම | 980,000 | 2012.04.15 | 2012.12.31 | - | -එම- |

## 1.10 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කර ඇති ඇතැම් ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ශ්‍රී ලංකා ක්‍රම සම්පාදන සේවයේ II පන්තියේ II ශ්‍රේණියට අධි සේවක පදනම මත පත්වීම් ලැබ ඇති සංවර්ධන සහකාර නිලධාරීන් 14 දෙනෙකු මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්තව, සේවය කරනු ලබන අතර එම නිලධාරීන්ගේ පත්වීම් ලිපිවල 05 ඡේදයට අනුව "උපලේඛනගත තනතුරුවලට ලබා දී ඇති වරප්‍රසාද වැනි දෑ නොමැතිව ගෙවනු ලබන වැටුපට පමණක් හිමිකම් ලබනු ඇත" යන්නෙන් දකවා තිබුණත් 2012 වර්ෂය තුළ යථෝක්ත විධිවිධානවලට පටහැනිව ඔවුන් සඳහා දුරකථන බිල්පත් වෙනුවෙන් එකතුව රු. 295,057 ක් රජයේ මුදලින් පියවීම් කර තිබුණි.

(ආ) දිස්ත්‍රික් ලේකම්වරයා පදිංචි රජයේ නිවාසයේ දුරකථනය සඳහා වූ රු.56,083ක හිඟ හිටි දුරකථන ගාස්තු අයකර ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් අනුගමනය නොකිරීම හේතුවෙන් දුරකථන සම්බන්ධතාවය විසන්ධි කර තිබුණ අතර, එම හිඟ හිටි ගාස්තු විශ්‍රාමික දිස්ත්‍රික් ලේකම්වරයාගෙන් අයකර ගැනීමට කටයුතු නොකර ඒ වෙනුවට එම නිවස සඳහා නව දුරකථනයක් සවි කරගෙන තිබුණි.

## 1.11 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණයේ දී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

2010 මැයි 30 දින පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් සතු වාහනයක් අනතුරකට භාජනයවී තිබූ අතර, සිදු වී ඇති සමස්ථ අලාභය වූ රු.40,312 ක පූජාපිටිය ප්‍රාදේශිය ලේකම්වරියගෙන් අයකර ගැනීමට රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් විසින් දන්වා තිබුණ සියයට 60ක් එනම් රු.24,187ක් විගණන පරීක්ෂණ අවස්ථාව වූ 2012 ඔක්තෝබර් 17 දින වන විටත් අයකර ගැනමට කටයුතු කර නොතිබුණි.

## 1.12 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

ජාතික ජල සම්පාදන මණ්ඩලය මඟින් පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කන්ද හන්දිය ගමේ ජල ගබඩා ටැංකියක් ඉදිකිරීමට පර්චර්ස් 20ක ඉඩම් කොටසක් අත්පත් කර ගැනීම පිණිස ලැබී තිබූ රු.1,448,286ක වන්දි මුදල උපයෝගී කරගෙන අදාළ කාර්යය සඳහා වැය නොකර 2009 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 1.13 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 82 | 73 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 46 | 62 | - | 16 |
| (iii) | ද්විතියක මට්ටම | 1822 | 1409 | 413 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 230 | 204 | 26 | - |
| (v) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 05 | 12 | 07 | |
| | එකතුව | 2185 | 1760 | 455 | 16 |

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මධ්‍යම රජයේ සේවය කිරීම සඳහා මනාපය පළ නොකළ මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා පත්වීමක් මත සේවය කරනු ලබන පළාත් සභා සේවකයින් දෙදෙනෙකුට 2012 වර්ෂය තුළ මධ්‍යම රජයේ ප්‍රතිපාදන මඟින් වැටුප් වශයෙන් රු.2,424,791ක් ද, ආපදා ණය වශයෙන් රු.126,680ක් ද ගෙවීම් කර තිබුණි.